**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘති සඳහා පූර්ව සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතිය - 2023**

-----------------------------------------------------------------------------------------------------------------------------

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘති සඳහා පූර්ව සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹී අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරණ ණය ගිවිසුමේ (iv) ව්‍යවස්ථාවේ 03 (අ) වගන්තියෙහි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, ප්‍රවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතියේ සූදානම වැඩි දියුණු කිරීමයි. කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම සැලසුම් කිරීම සඳහා උපදේශන සේවා සැපයීම යන එක් සංරචකයක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1654.54 කට සමාන එ.ජ.ඩො. මිලියන 11.36 ක් වන අතර ඉන් රු. මිලියන 1456.50 කට සමාන එ.ජ.ඩො. මිලියන 9.99 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 198.04 ක් ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘතිය 2016 ඔක්තෝම්බර් 28 වන දින එහි කටයුතු ආරම්භ කර 2022 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය සඳහා ණය ගෙවීම අවසන් කිරීමේ දිනය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන ව්‍යාපෘති සඳහා පූර්ව සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‌රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | මුදල රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි අංක 27 වගන්තියට අනුව, අස්තිත්වය මගින් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කළ යුතුය. සමස්ත ව්‍යාපෘතිය සඳහා තථ්‍ය පොළී පිරිවැය රු. මිලියන 232.90 කට සමාන ඇමෙරිකානු ඩොලර් 609,455ක් වූ | මිලියන 42.22 | 2023 වර්ෂයේදී ණය පොළී ගිණුම්කරණය සඳහා ව්‍යාපෘති කළමනාකරණ අත්පොතේ (PAM) කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබීම හේතුවෙන්, 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කර නොමැත. තවද, 2023.06.30 දිනට ව්‍යාපෘතියේ ණය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් පිළියෙළ කළ යුතුය. |

| | |
|---|---|
| අතර 2023 දෙසැම්බර් 31 දිනට මුළු පොළී ගෙවීම රුපියල් මිලියන 190.68 කට සමාන ඇමෙරිකානු ඩොලර් 498,970 ක් වීම හේතුවෙන්, රුපියල් මිලියන 42.22 කට සමාන ඇමෙරිකානු ඩොලර් 110,485 ක් වූ ගෙවිය යුතු පොළී වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි. | කාලසීමාව අවසන් වී ඇති බැවින්, අනාගතයේදී ද ව්‍යාපෘතිය මගින් ගිණුම්ගත නොකළ ණය පොළිය ගිණුම්ගත කිරීමට කිසිදු නීතිමය පසුබිමක් නොමැත. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ)ව්‍යාපෘතියේ උපදේශනය, ශක්‍යතා අධ්‍යයනය සහ විස්තරාත්මක සැලසුම් | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ (CSRP) ප්‍රධාන අරමුණ වූයේ ඉදිරි වසර 20 සඳහා ජාතික ප්‍රවාහන පද්ධතියට ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දායකත්වය සහතික කිරීම සඳහා කොළඹ තදාසන්න ප්‍රදේශයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය සංවර්ධනය කිරීමයි. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1,551.3 ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 8.52 ක් දැනටමත් ලබා දී ඇති අතර, ශක්‍යතා අධ්‍යයනය සහ විස්තර සැලසුම් සඳහා උපදේශන සේවා ලබා දීම සඳහා උපදේශන සේවා ලෙස රුපියල් මිලියන 1,469 ක් (සියයට 95 ක්) ගෙවා තිබුණි.<br><br>මෙම ව්‍යාපෘතියට අදාළ වාර්තා පිළියෙළ කර 2021 මාර්තු මාසයේදී රේඛීය අමාත්‍යාංශයට භාර දී වසර 2කට වැඩි කාලයක් ගත වී ඇතත්, එම වාර්තා දුම්රිය පද්ධතියේ අනාගත සංවර්ධනය සඳහා යොදා ගැනීම අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් වාර්තා පිළියෙළ කර 2021 අප්‍රේල් 30 දින වන විට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. මෙයින් මෙම ව්‍යාපෘතියට අයත් කාර්යය අවසන් වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘති කාර්යයන් ලෙස හඳුනාගෙන නොමැත. | හැකි ඉක්මනින් අදාළ දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් සම්පාදනය කළ යුතුය. |
| (ආ) ණය පොළිය | ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතිය අවසන් කර 2022 දෙසැම්බර් 31 දින භාර දීමට යෝජිත වූ අතර, එම දිනයේදී ව්‍යාපෘතිය මගින් කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට (CSRP) අදාළ ආසියානු සංවර්ධන බැංකුවේ ණය උපයෝජනය | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුමේ නියමයන්ට අනුව, ව්‍යාපෘතිය වසා දමන දිනය දක්වා ණය පොළී වියදම ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කළ යුතුය. ඒ අනුව | එක් එක් සංරචකය අනුව ව්‍යාපෘති පිරිවැය සඳහා සැලසුම් සහ ගිවිසුම් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර අවසන් කර තිබුණි. එහෙත් ණය ගිවිසුම යටතේ පහසුකම් ලබා ගත් අනෙක් පාර්ශව එම මුදල් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට නොගැනීම නිසා පොළී වියදම අඛණ්ඩව උද්ගත වීම හේතුවෙන්, වැඩ අවසන් වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට, ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් 102,087.41 ක පොළී පිරිවැයක් අය කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ණය පොළිය ලෙස කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) සඳහා ඇමෙරිකානු ඩොලර් 102,087.41 ක් වෙන් කරන ලදී. | |
| (ඇ) සුහුරු ටිකට්පත් සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය | කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (CSREIP) යටතේ දුම්රිය සේවාව සඳහා සුහුරු ටිකට්පත් සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය උප ව්‍යාපෘතියක් ලෙස දැනට ක්‍රියාත්මක වේ. එම උප ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා ගාස්තු වශයෙන් රුපියල් මිලියන 19 ක වියදම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) මගින් දරා තිබුණි.<br><br>මෙම ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 17 දින සිට වසර 03ක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු වුවද, උප ව්‍යාපෘතිය අපේක්ෂිත ප්‍රගතිය ලබා නොතිබීම හේතුවෙන් මෙම උප ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් ඵල රහිත වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | පද්ධතිය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් ලේඛන පිළියෙළ කිරීම වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය මගින් සුහුරු ටිකට්පත් සහ ආසන වෙන් කිරීමේ ක්‍රමය සඳහා උපදේශන සේවා භාවිත කරන ලදී. අදාළ දෙස් විදෙස් උපදේශකයින් විසින් අදාළ කටයුතු නිසි පරිදි සම්පූර්ණ කරන ලද අතර ලංසු ලේඛන භාවිතා කර ලංසු කැඳවා ජාත්‍යන්තර තරඟකාරී මිල ක්‍රමය (ICB) යටතේ කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගන්නා ලද අතර කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වෙමින් පවතී. | හැකි ඉක්මනින් ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) යටතේ කැලණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා කැලණිවැලි දුම්රිය මාර්ගය ඔස්සේ මාර්ග අයිතියේ (RoW) පදිංචි පවුල් නැවත පදිංචි කිරීමට අවශ්‍ය නිවාස ඒකක සඳහා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ ප්‍රවාහන අමාත්‍යාංශය (MoT) 2017 සහ 2018 වර්ෂවලදී කැලණිවැලි දුම්රිය මාර්ගය පුළුල් කිරීම සම්බන්ධ නියමයන් සහ කොන්දේසිවලට අදාළව අවබෝධතා ගිවිසුම් හතකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව ගිවිසුම්ගත වූ දින සිට වසර දෙකක් ඇතුළත අදාළ නිවාස ඒකක අවසන් කර ව්‍යාපෘතියට භාරදිය යුතු විය. | | |

| | | |
|---|---|---|
| (අ) නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ රු. මිලියන 5,412 ක් වැය කරමින් නිවාස ඒකක 1244 ක් මිලදී ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණ ද, නාවල 01 අදියරෙන් නිවාස ඒකක 406ක් ද, නාවල 02 අදියර සංකීර්ණයෙන් නිවාස ඒකක 144ක් ද ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් මෙතෙක් භාරදී නොතිබුණි. නාවල අදියර 02 සංකීර්ණයෙන් මිලදී ගන්නා නිවාස ඒකක 144 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 502 ක මුදලක් ගෙවා තිබුණි.<br><br>එම නිවාස සංකීර්ණ ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 80ක් සහ සියයට 39ක් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තු දිනය වූ 2024 මාර්තු 31 දිනට එම නිවාස ඒකක භාර දීමට නොහැකි වි තිබුණු බව නිරීක්ෂණය විය. | 2024 පෙබරවාරි 29 දිනට නිවාස ඒකකවල ඉදිකිරීම් ප්‍රගතිය 89% කි. රටේ පැවති විදුලි අර්බුදය, ඉන්ධන හිඟය සහ රටේ මහජන විරෝධතා හේතුවෙන් දින දීර්ඝ කිරීම මත එකඟ වූ කාල සීමාව තුළ නිවාස ඒකකවල ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අවබෝධතා ගිවිසුම තවත් මාස 6කින් දීර්ඝ කිරීමට කටයුතු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලිපියක් ඉදිරිපත් කර තිබුණි. එම කාලසීමාව තුළ ඉතිරි 11% ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නැවත පදිංචි කිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |
| (ආ) නාවල අදියර 01 නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබීම හේතුවෙන් සහ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමෙන් පසු මිල විචලනය සඳහා ගැළපීම් සිදු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය තීරණය කර තිබීම හේතුවෙන් 2024 ජනවාරි 03 දිනැති ලිපියට අනුව නිවාස ඒකකයක මිල රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා ඉහළ යාමේ අවදානමක් ඇති වී තිබුණි. | නාවල (අදියර 1) සංකීර්ණයෙන් ලබාදීමට නියමිතව තිබූ නිවාස ඒකක 406 ක් අත්පත් කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණද, නාගරික සංවර්ධන අධිකාරිය සහ අදාළ ඉදිකිරීම් සමාගම සමඟ ඇති වූ නීතිමය ගැටලුවක් හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර කර ඇත. 2023/08/10 දින නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රකාශ කළේ එම නිවාස 2024 මාර්තු 24 වන විට ලබා දිය නොහැකි බවත්, මිල විචලනයට අනුව, රුපියල් මිලියන 05 ක මුදලකට ලබාදීමට එකඟ වූ නිවාස ඒකකයක මිල රුපියල් මිලියන 10 දක්වා වැඩි වන බවත්ය.<br><br>නැවත සමීක්ෂණයට අනුව, KV මාර්ගයේ මාලිගාවත්ත සිට පාදුක්ක දක්වා නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් කිරීමට අවශ්‍ය වන්නේ තවත් නිවාස ඒකක 100ක් පමණි. ඒ අනුව, නිවාස 406 න් නිවාස 100 ක් ලබා ගැනීම සඳහා සකස් කර ඇති මිල ගණන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය තීරණයක් ගැනීමෙන් අනතුරුව, අදාළ නිවාස ඒකක ලබාගැනීමට ද තීරණය කරන ලදී. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කර ඉදිකිරීම් පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මූලික අවබෝධතා ගිවිසුමට අනුව, එකඟ වූ දින සිට වසර 02ක් ඇතුළත නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් කර එම නිවාස ව්‍යාපෘතියට භාර දිය යුතු වේ. ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් 2018 වසරේ සිට නිවාස ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමේ දිනය අවස්ථා තුනකදී දීර්ඝ කර නව අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇත. පවුල් නැවත පදිංචි කිරීමේ කටයුතු තවදුරටත් ප්‍රමාද වීම හේතුවෙන් කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) සංවර්ධනය කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය අඛණ්ඩව දීර්ඝ කිරීමට සිදු වූ අතර එය අවසන් කරන දිනය තවත් මාස 06කින් දීර්ඝ කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නැවත පදිංචි කිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතුය. |